# භූගෝලීය ව්‍යුහය

කෑගල්ල, මධ්‍යම කඳුකරය සහ බටහිර දකුණු තැන්තලා අතර පිහිටා ඇති සිත් ඇදගන්නා සුළු පරිසරයක් ඇති මනරම් භූමියකි. බටහිර කලාපයේ මුහුදු මට්ටම් උස මීටර් 150 (අඩි 500) ට වඩා අඩු වන අතර නැගෙනහිර කලාපය මීටර් 300 (අඩි 1,000) ඉක්මවයි. දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත වී ඇති අතර කෝපි, කොකෝවා, ගම්මිරිස්, කරාබු නැටි සහ සාදික්කා වැනි සුළු අපනයන භෝග දිස්ත්‍රික්කයේ ආර්ථිකයේ වැදගත් ස්ථානයක් ගනී. ශ්‍රී ලංකාවේ පැරණිතම මිනිරන් පතල පිහිටා ඇත්තේ කෑගල දිස්ත්‍රික්කයේ බෝගල නම් ස්ථානයේ ය. දිස්ත්‍රික්කයේ ප්‍රමාණය හෙක්ටයාර 169,280 (අක්කර 418,300) කි.

